Page 7 October 2009.qxd 19/10/2009 23:46 Page 1





Children's Corner

### උදෑසනක්



ගස උඩ සිටි
රතු කුකුළා
බිමට බැහැල
තටු ගසලා
කොක් කොක්
කොක් කෝ
කියලා
අවදිවන්න
අණ කරලා

කිටියගෙ පොඩි සුදු පැටියා
මූණ කටත් සෝදාලා
අම්මාගෙන් කිරි බීලා
දඩයමකට ඉව අල්ලා
කුරුමානම වැරදීලා
කැරපොත්තා පැන දුවලා

අප්පච්චිගෙ මුර සෙබළා
එළිවෙනකම් නිදි මරලා
බූරු ඇඳේ යටට වෙලා
තවමත් නිදි ගුළිගැහිලා

♦ දේශාන් පෙරේරා
නාලන්ද විදුහල කොළඹ
Sri Lanka

### සුරතල් පූසා

පුළුන් ගොඩක් වගෙයි
සුදු පාටට දිළිසෙයි
ලෝම ගුළිය පුම්බ පුම්බ
පුරු පුරු ගී ගයයි



රැවුල පොඩ්ඩ ලෙව කකා
සුරතල්කම පෙන්නලා
කන්දෙක උස්සාගෙන
පැන පැන සෙල්ලම් කළා

වලිගය වන වනා
මගෙ වට දුව දුවා
ඇවිත් ළඟම දැවෙටෙමින්
මා ළඟ සුරතල් වුණා

♦ පී එස් චානි මධූෂා
සෝමාදේවි මහා විද්‍යාලය
සෙවනගල Sri Lanka

### Know about Sugar? සීනි ගැන දන්නවාද?

Sugar making was known in India as early as 3000BC. Growing cane and making sugar was made known from India to Indo China and then to the Arab and Europe. By the 8th century, sugarcane was growing in Spain and France as well. In 1493, on his second voyage, Christopher Columbus took sugarcane to the New World. The success of sugar plantation in Santo Domingo soon spread to all West Indies islands. Sugar was initially dispensed as a sedative. As a food sweetener it was a scarce luxury until the 17th century. It remained expensive and was listed in 1736 among the wedding gifts of Maria Theresa, future queen of Hungary.

ක්‍රිස්තු පූර්ව 3000 සිට ඉන්දියාව සීනි ගැන දැන සිටියාය. උක් වවා සීනි සෑදීමේ ක්‍රමය ඉන්දියාවෙන් චීනයටද, අරාබිය හරහා යුරෝපයටද ගියේය. ක්‍රිස්ටෝපර් කොලොම්බස් සිය දෙවන දේශාටනයේ දී උක්ගස ඇමරිකාව හෙවත් නව ලෝකයට රැගෙන යාම නිසා ඉක්මනින් එය බටහිර ඉන්දියානු දූපත් වලටද පැතිරිණ. මුලින් සීනි සිරුර සන්සුන් කරන බෙහෙතක් විය. එය මුතු මැණික් මෙන් අගය කෙරිණ. 1736 දී මාරියා තෙරේසා නම් හන්ගේරියානු රැජිණට ලැබුණ තෑගි අතර සීනි පාර්සලයක් ද වූ බව කියති.

♦ *Auntie Ramani* ( රමණි නැන්දා)

### අපේ එළවළු කොටුව



වම්බටු තක්කලි කරවිල කංකුන්
මෑ දෙහි සාරණ ඉන්නල ආදී
මේ සැමදේ හොඳ කෑමට ගන්නා
ඇත්තෙය අපගේ එළවළු කොටුවේ

සෑම දිනේහිම මාගෙ පියාණන්
සමග ගොසින් නෙක වල් උදුරාලා
පෝර යොදා දිය වත්කරමින් මම්
ආදරයෙන් වවනෙම් මෙම ගස්වැල්

♦ මෙලනි රංගිකා
කිංස්ටන් ජාත්‍යන්තර පාසැල ගල්කිස්ස Sri lanka


BOC

ලංකා බැංකුව
BANK OF CEYLON

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

ලන්ඩන් ශාඛාව




No 1, Devonshire Square, London EC2M 4WD

Phone : 020 7377 1888 Fax: 020 7377 5430

e-mail : bankofceylon.uk@btclick.com

Our Web - www.boc.lk

Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit




## වනාන්තරය යනු මිනිසාගේ 'මහ ගෙදර' යි

උත්ස්වේදනය නමැති ක්‍රියාව මගින් වනාන්තරයේ ශාක වලින් විශාල ජලවාෂ්ප ප්‍රමාණයක් වායුගෝලයට එකතු වේ. එම ජලවාෂ්ප මගින් වායුගෝලීය ජලවාෂ්ප සංතෘප්ත වී වර්ෂාව ඇතිකරයි.

වර්ෂාව මගින් වනාන්තරයට වැටෙන ජලය එහි ශාක ස්තර අතරින් පතිතවීමේ දී වේගය අඩුවේ. මේ ජල බිංදු පොළව යටට ගමන්කර උල්පත්වල ගබඩා වේ. වියලි කාලවලදී ඇල දොල ගංගාවලට ජලය සැපයෙන්නේ මෙම උල්පත් මගිනි.

අධික වර්ෂා කාලවලදී වනාන්තරයට පතිත වන ජලයෙන් වැඩි කොටසක් මතුපිටින් ගලා යයි. ශාකවල ඝන මූල පද්ධති මගින් මේ ජලයෙන් පස සෝදායාම වලක්වයි. එබැවින් රොන් මඩ නොමැති පිරිසිදු ජලය පමණක් ඇල දොල ගංගාවලට එකතු වේ. මේ නිසා වනාන්තරය මගින් ජලාශ ගොඩවීම් හා හදිසි ගංවතුර තර්ජන අවම කරවයි.

වනාන්තර පසෙහි මතු පිට ඇති අධික හියුමස් තට්ටුව මගින් භූගත ජලය ආරක්ෂාකරයි.

එම හියුමස් වලින් කොටසක් ගංගා ඔස්සේ පැමිණ පිටාර ගැලීමෙන් කෙත්වතු සරුකරවයි.

අධික ලෙස එකතුවන කාබන් ඩයොක්සයිඩ් වායුවෙන් කොටසක් වනාන්තර මගින් උරාගැනීම නිසා වනාන්තර වායුගෝලීය උෂ්ණත්වය ඉහළයාම ද පාලනය කරයි.

නායයෑම් වැළැක්වීමට ද වනාන්තර උපකාරීවේ.

අනාදිමත් කාලයක සිට මිනිසාට ආහාර ඖෂධ, දැව, වැල් වර්ග, ඉටි, තෙල් වර්ග, මීපැණි හා දුම්මල වැනි දේවල් ලබාදුන්නේ වනාන්තරයයි.

ආදි මිනිසාගේ නිවහන වූයේ වනාන්තරයයි
ගස්වැල් ඔහුගේ සොහොයුරියෝ වූහ.
වන සතුන් ඔහුගේ සොහොයුරෝ වූහ.
ඇල දොල ගංගා කඳු හෙල් ඔහුගේ වැඩිහිටියෝ වූහ.
මේ සියල්ලම ඔහුට දයාවන්ත විය.

එබැවින් වනාන්තරය යනු නූතන මිනිසාගේ **මහගෙදර** ය.

විශ්‍රාමලත් විදුහල්පති
♦ එස් ජයසුන්දර උඩුගම Sri Lanka

## Birthday Greetings! ❊ උපන්දින සුබ පැතුම්!



**Ashendri Mendis**
Nugegoda - Sri Lanka



**Pavith Hansana Mohotti**
London



**Sandali Hansana Mohotti & Latiesha Annalise Kodituwakku** - London

### The Birthday Cake

Today is my birthday
I think I'll make a cake
Mix and stir, stir and mix
Then into the oven to bake

### ඔබ සැමට සුබ උපන්දිනයක් වේවා!

Here's the cake so nice and round,
I'll put icing on so white.
I'll put on all the candles on top
To make my birthday bright!

